හෙලන්කෝ හොටෙල් ඇන්ඩ් ස්පා ප්‍රයිවට් ලිමිටඩ් - 2019

## 1.1 මතය

මෙහෙලන්කෝ හොටෙල් ඇන්ඩ් ස්පා ප්‍රයිවට් ලිමිටඩ් ("සමාගම") හි 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ හා වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

2019 දෙසැම්බර් 31 දිනට සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### කරුණු අවධාරණය කිරීම

මාගේ මතය තත්ත්වාගණනය කිරීමකින් තොරව, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අඛණ්ඩ පැවැත්ම උපකල්පනය පිළිබඳ මූල්‍ය ප්‍රකාශනවල සටහන 2.5 වෙත මම අවධානය යොමු කරවමි. ඉහත සටහනේ දක්වා ඇති පරිදි, හම්බන්තොට හෝටලය ඉදිකිරීමේ ව්‍යාපෘතිය නතර කිරීමට සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස, සමාගමේ හෝටල් ඉදිකිරීම් කටයුතු අවසානයකට ළඟා වී ඇත. තවද, 2017 අගෝස්තු 1 දිනැති කැබිනට් තීරණ අංක 17/1613/733/029 ට අනුව, සමාගමේ හිමිකාරීත්වය, එහි කොටස් හිමියන්ට ඔවුන්ගේ කැන්විල් හෝල්ඩින්ස් (ප්‍රයිවට්) ලිමිඩඩ් (මව් සමාගම) හි කොටස් හිමිකාරීත්වයට සමානුපාතිකව පැවරීමට රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය උපදෙස් දී තිබේ. හෙලන්කෝ හොටෙල්ස් ඇන්ඩ් ස්පා (ප්‍රයිවට්) ලිමිටඩ් හි කැන්විල් හෝල්ඩින්ස් (ප්‍රයිවට්) ලිමිඩඩ් සතු කොටස් පැවරීම ස්වාධීන තක්සේරුවක් මත පදනම් විය යුතු අතර වාර්තා කළ දිනට එය වෙමින් පැවතුණි. එබැවින්, සමාගම අපේක්ෂිත අනාගතයේදී ඈවර කිරීමට සමාගම තීරණය කර නොමැත. එම නිසා, මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩ පැවැත්ම පදනම මත අඛණ්ඩව පිළියෙල කරනු ලැබේ.

## 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ

පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම, අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීම ද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

**2018** අංක **19** දරන ජාතික විගණන පනතේ **16(1)** වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

**1.4** මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැළසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, වැරදි නියෝජනය හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැළසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත සමාගමේ අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා

ප්‍රමාණාත්මකව සැළසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩල විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව සමාගම කටයුතු කර ඇති බව,
- සමාගමේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව

**1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 16 (SLFRS 16) | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| SLFRS 16 - කල් බදු ප්‍රමිතිය අනුව, 2019 ජනවාරි 1 සිට ක්‍රියාත්මක වන පරිදි කල් බදු හිමියකු සියලු කල් බදු ඔහුගේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ කල් බදු වගකීම හා අනුරූපී වත්කම පාවිච්චි කිරීමේ හිමිකම ලෙස හඳුනා ගැනීම අවශ්‍ය කෙරේ.<br><br>සමාගම, මුළු වටිනාකම රු. 172,317,838 කට වසර 99 ක කල්බදු ගිවිසුමක් යටතේ හම්බන්තොට හෝටල් ඉදි කිරීම සඳහා නාගරික සංවර්ධන අධිකාරියෙන් ඉඩමක් ලබා ගන්නා ලදි. සමාගම කල්බදු ඉඩම ඉහත ප්‍රමිතිය ප්‍රකාරව ශේෂ පත්‍රය තුළ වත්කම පාවිච්චි කිරීමේ හිමිකමක් ලෙස හා කල්බදු වගකීම් ලෙස හඳුනා ගෙන නොතිබුණි. | වත්කම පාවිච්චි කිරීමේ හිමිකම හඳුනා ගැනීම සම්බන්ධ නිරීක්ෂණය සමඟ එකඟ වේ.<br><br>කෙසේ වෙතත්, කල්බදු වගකීම එකවර ගෙවීමක් ලෙස සම්පූර්ණයෙන්ම පියවා ඇති නිසා සමාගම විසින් එය හඳුනාගෙන නැත. | කළමනාකරණය ප්‍රමිතිය සමඟ අනුකූල වීමට පියවර ගත යුතුය. |

| රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛ අංක පීඊඩී 12 | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2003 ජූනි 2 දිනැති රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛ පීඊඩී 12 - යහපාලනය සඳහා මගපෙන්වීම හි අංක 9.7 ප්‍රකාරව, වැටුප් හා දීමනාවන් අනුමත බඳවා ගැනීමේ හා උසස් කිරීමේ යෝජනා ක්‍රම මත පදනම් විය යුතු අතර භාණ්ඩාගාර ලේකම්ගේ අනුමැතිය නොමැතිව සංශෝධනයට අවසර නොදේ. කෙසේ වුවද, සමාගම ජ්‍යෙෂ්ඨ කළමනාකරණයේ වැටුප් සඳහා අනුමැතියන් ලබා ගෙන නොතිබුණි. | සලකා බලනු ලබන කාලසීමාව තුළ හෙලන්කෝ හොටෙල්ස් ඇන්ඩ් ස්පා (ප්‍රයිවට්) ලිමිටඩ් යටතේ සේවකයන් බඳවා ගැනීමක් සිදු වී නැත. | හිමිකාරිත්ව සමාගමේ සේවාවන් වියදම් බෙදා ගන්නා බැවින් චක්‍රලේඛය සමඟ අනුකූල වීමට පියවර ගත යුතු අතර පරිපාලිත සමාගම්වලට ද එය අනුගමනය කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 25,299,887 ක ලාභයක් වූ අතර ඉකුත් වර්ෂයේ අනුරූප ලාභය රු. 31,848,469 ක් විය. එබැවින්, මූල්‍ය ප්‍රතිඵලයේ රු.6,548,582 ක පරිහානියක් නිරීක්ෂණය විය. සමාලෝචන වර්ෂයේදී වෙනත් මෙහෙයුම් ආදායම රු. 10,577,783 කින් අඩුවීම මෙම පරිහානියට හේතු වී තිබුණි.

### 2.2. ප්‍රධාන ආදායම් හා වියදම් අයිතමවල ප්‍රවණතා විශ්ලේෂණය

පසුගිය වර්ෂ හතරක ආදායම, පරිපාලන වියදම් හා ශුද්ධ ලාභ/ අලාභ පහත පරිදි වේ.

| වර්ෂය | 2019 | 2018 | 2017 | 2016 | 2015 |
|---|---|---|---|---|---|
| | Rs | Rs | Rs. | Rs | Rs. |
| මුළු ආදායම | 39,142,280 | 49,770,092 | 89,054,257 | 269,521,228 | 249,803,774 |
| පරිපාලන වියදම් | 4,003,549 | 6,415,872 | 7,354,115 | 18,926,521 | 10,497,440 |
| බදු පසු ශුද්ධ ලාභය/ අලාභය | 25,299,887 | 31,848,469 | 63,498,793 | 227,498,057 | 95,160,112 |

### 2.3. අනුපාත විශ්ලේෂණය

මූල්‍ය ප්‍රකාශන සහ විගණනයට සපයන ලද තොරතුරුවලට අනුව, සමාලෝචිත වර්ෂයේ සමහර වැදගත් අනුපාත ඉකුත් වර්ෂය සමඟ සසඳා පහත දැක්වේ.

| අනුපාත | 2019 | 2018 |
|---|---|---|
| ජංගම අනුපාතය | 13.33:1 | 66.07:1 |
| ක්ෂණික වත්කම් අනුපාතය | 13.33:1 | 66.07:1 |
| යෙදවූ ප්‍රාග්ධනයට ප්‍රතාලාභ අනුපාතය | 11.51:1 | 3.78:1 |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1. මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව විසින් ලබා දෙන ලද නියෝග ප්‍රකාරව, සමාගම විසින් සිනෝ ලංකා හොටෙල්ස් ඇන්ඩ් ස්පා (ප්‍රයිවට්) ලිමිටඩ් සමඟ කිසිදු ලිඛිත ගිවිසුමක් නොමැතිව රු. මිලියන 400 ක කෙටි කාලීන ණයක් (රු. මිලියන 300 ක් 2018 ජනවාරි 12 දින ලබා දී ඇති අතර රු. මිලින 100 ක් 2018 ජනවාරි 18 දින ලබා දී ඇත.) සියයට 8.79 ක පොළී අනුපාතයක් යටතේ සිනෝ ලංකා හොටෙල්ස් ඇන්ඩ් | නිරීක්ෂණය සමඟ එකඟ වේ.<br><br>යෝජිත ණය වැඩසටහන හෝ ග්‍රෑන්ඩ් හයට් ව්‍යාපෘතිය විකිණීමේ (divestiture) වැඩසටහන හරහා අවශ්‍ය මූල්‍ය කටයුතු සංවිධානය නොවූ හෙයින් එම ණය පියවීමේ කාලය පුරාම ග්‍රෑන්ඩ් හයට් ව්‍යාපෘතිය | නියමිත වේලාවට ණය අයකර ගැනීමට කළමනාකරණය පියවර ගත යුතු අතර සමාගමට ඉහළ ආදායමක් ලබා ගැනීම සඳහා එම මුදල් ආයෝජනය කළ යුතුය. |

ස්පා (ප්‍රයිවට්) ලිමිටඩ් වෙත ලබා දී තිබුණි. සමාගම ලැබිය යුතු පොලිය මූල්‍ය ප්‍රකාශනයේ පෙන්වා තිබුණ ද, විගණන දිනය වන තුරුත් සිනෝ ලංකා හොටෙල්ස් ඇන්ඩ් ස්පා (ප්‍රයිවට්) ලිමිටඩ් මෙම මුදල් පියවා නොතිබුණි. විස්තර පහත දැක්වේ.

| වර්ෂය | පොලී මුදල (රු) |
|---|---|
| 2018 | 33,915,753 |
| 2019 | 35,160,000 |
| එකතුව | 69,075,753 |

මූල්‍ය අර්බුදයකට මුහුණ දී තිබේ. එබැවින්, ණය පියවීම කෙටි කාලීන පදනමින් සිදු නොවුණි.